ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date. 2025.07.21

ඩබ්ලිව්.එම්.බන්දුල බණ්ඩාර
අංක 175, ගල්එළිය
රුහුණුගම
අරලගංවිල

පැමිණිලිකාර පාර්ශවය

ඩබ්ලිව්.එම්.පවන් සත්සර
අංක 175, ගල්එළිය
රුහුණුගම
අරලගංවිල

වින්දිත පාර්ශවය

1. ඩී.එම්.ජයසේන
   උප පොලිස් පරික්ෂක
   පොලිස් ස්ථානය, අරලගංවිල

2. වසන්ත ප්‍රේමලාල්
   ප්‍රධාන පොලිස් පරීක්ෂක
   ස්ථානාධිපති (හිටපු)
   පොලිස් ස්ථානය, අරලගංවිල

වගඋත්තරකාර පාර්ශවය

**පැමිණිලි අංකය : HRC/ANU/12/2023(S)**

**පැමිණිලිකාර පාර්ශවෙය් කරුණු දැක්වීම**

පැමිණිලිකරු විසින් 2023.01.27 වන දින ඉහත අංක දරණ පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, වයස අවුරුදු 10ක් පමණ වන තම බාල පුතා වන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය විසින් 2022.11.26 වන දින අසල නිවසකට ඇතුළු වී කුඩා වීස් කැබැල්ලක්, පෙන් ඩ්‍රයිව් එකක්, කුඩා බ්ලූටූත් ස්පීකරයක් සහ මාළු පැටවුන් කිහිප දෙනෙකු සොරාගෙන ඇති බවයි. මෙම සිදුවීම සිදුවී දින 20ක් පමණ ගතවීමෙන් පසු තම පුතා ළග තිබූ පෙන් ඩ්‍රයිව් එක නැවත ඔහු එය සොරා ගත් නිවසේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සිටින තමා පුතාගේ වයසේ පසුවන ඔහුගේ යහළුවා වෙත ලබාදී ඇති බවත්, කරුණු එසේ සිදු වී තිබුණද තමා ඒ කිසිවක් නොදැන සිටි බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

අනතුරුව 2022.12.24 වන දින ප.ව.5.00ට පමණ අරලගංවිල පොලිස් ස්ථානයේ නිලධාරීන් දෙදෙනෙකු තම නිවසට පැමිණ මෙම භාණ්ඩ සොරා ගැනීම පිළිබඳව තමා පුතාගෙන් විමසන ලද බවත්, පසුදින පුතා සමඟ පොලිස් ස්ථානයේ පෙනී සිටින ලෙසට එකී නිලධාරීන් විසින් දන්වන ලද බවත්, ඒ අනුව තමා තම බිරිඳ හා පුතා සමඟ 2022.12.25 වන දින පෙ.ව.9.00ට අරලගංවිල පොලිස් ස්ථානය වෙත ගිය බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එලෙස පොලිස් ස්ථානය වෙත ගිය පසු තම පුතා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය පොලිස් ස්ථානයේ කාමරයක් තුළට රැගෙන ගිය බවත්, තමා හා තම බිරිඳ එම කාමරයෙන් පිටත රඳවනු ලැබූ බවත්, මෙලෙස පෙ.ව. 9.00 සිට ප. ව.6.00 දක්වා තම පුතා පොලිස් ස්ථානයේ රඳවා ගත් බවත් පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත.

පසුව තම පුතා තමන්ට භාරදුන් බවත්, එම අවස්ථාවේ දී තම පුතා හට පොලිස් නිලධාරියෙකු විසින් පහර දී පුතාගේ ඔළුව අසල තිබූ මේසයක වැද්දූ බව පුතා විසින් තමාට පැවසූ බවත්, ඒ බව පැවසීමට පුතා තමා අසලට දිව ඒමේ දී පොලිස් නිලධාරියෙක් පැමිණ පුතාගේ බෙල්ලෙන් අල්ලා පුටුවට තල්ලු කළ බවත්, එවිට පුතාගේ බෙල්ල සීරීමකට ලක්වූ බවත් පැමිණිලිකරු සිය පැමිණිල්ල තුළින් දක්වා ඇත.

තවද, තමා පුතා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය නිවසට පැමිණි පසු ඔහුගේ ඔළුව රිදෙන බව තමා හට දන්වන ලද බැවින් 2022.12.26 වන දින පොලොන්නරුව රෝහල වෙත ඇතුළත් කළ බවත්, එහිදී නේවාසිකව ප්‍රතිකාර ලබා 2022.12.28 වන දින නිවසට පැමිණි බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ඉල්ලා සිටින්නේ, තම දරුවාට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් යුක්තිය ඉටුකර දෙන ලෙසයි.

<u>1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ඩී.එම්.ජයසේන යන අයගේ කරුණු දැක්වීම.</u>

උප පොලිස් පරීක්ෂක ඩී.එම්.ජයසේන යන අය විසින් 2023.08.29 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ, 2022.11.27 වන දින අරලගංවිල පොලිස් ස්ථානය වෙත පිටුව 328 ඡේදය 138 යටතේ නිවසක් බිඳ මුදල් හා දේපල සොරා ගැනීමක් සම්බන්ධව පැමිණිල්ලක් ලැබී තිබූ බවත්, මෙකී පැමිණිල්ල අනුව විමර්ශනයක් ආරම්භ කළ බවත්, මෙම පැමිණිලි විමර්ශනය අනුව සොරකම සිදුකළ තැනැත්තා පිළිබඳව කරුණු අනාවරණය වූ බවත්, මෙම සොරකම මෙම පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය විසින් සිදුකරන ලද බවට ද තොරතුරු අනාවරණය වූ බවත්, එකී තොරතුරු මත පදනම්ව පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය 2022.12.25 වන දින පොලිස් ස්ථානය වෙත කැඳවාගෙන එන ලෙසට

දරුවාගේ පියා වන පැමිණිලිකරුට දන්වන ලද බවත්, ඒ අනුව දරුවා දෙමාපියන් සමඟ 2022.12.25 දින පොලිස් ස්ථානය වෙත පැමිණි බවත්, එලෙස පැමිණි පසු දරුවාගෙන් සොරකම පිළිබඳව ප්‍රකාශයක් ලබාගත් බවත් ය.

තවද, 2022.11.27 වන දින පොලිස් ස්ථානය වෙත ලද ඉහත කී පැමිණිල්ලේ භාණ්ඩ සොරකම් කළ අය පිළිබඳව කිසිදු තොරතුරක් සඳහන් නොවූ බවත්, එබැවින් මෙකී අපරාධය සම්බන්ධයෙන් අංක බී 594/22/2 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කරන ලද බවත්, අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමෙන් පසුව මෙම සොරකම වයස අවුරුදු 10ක පමණ වයස ඇති පිරිමි දරුවෙකු විසින් සිදුකරන ලද බවට අනාවරණය වූ බවත්, මෙම වයසේ දරුවකු විසින් එවැනි අපරාධයක් සිදුකර ඇති අවස්ථාවක මෙකී වරද බල අපරාධයක් සේ නොසලකා කටයුතු කිරීමට නීතිමය ප්‍රතිපාදන සලසා දී ඇති බැවින් අදාළ චෝදනාව අධිකරණයෙන් ඉල්ලා අස්කර ගැනීම සඳහා කරුණු වාර්තා කර ඇති බවත්, මෙම දරුවාට තමා විසින් කිසිදු පහරදීමක් සිදුකර නැති බවත් 1 වන වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත.

**<u>2 වන වගඋත්තරකරු වන අරලගංවිල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ කරුණු දැක්වීම.</u>**

2 වන වගඋත්තරකරු වන අරලගංවිල පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා විසින් අංක 787/2023 සහ 2023.03.10 දිනැති වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමු කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2022.11.27 වන දින තම නිවස සොරුන් විසින් බිඳ දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් පොලිස් ස්ථානය වෙත ලද බවත්, මෙම පැමිණිල්ල මගින් අපරාධයට අදාළව කිසිදු පුද්ගලයෙකු නම් කොට නොතිබූ බවත්, එකී පැමිණිල්ලේ පැමිණිලිකරු විසින් 2022.12.25 වන දින නැවත ප්‍රකාශයක් ලබාදෙමින් විජේසිංහ මුදියන්සේලාගේ පවන් සත්සර, අංක 175, ගල්එළිය, රුහුණුගම යන අය මෙම සොරකමට සම්බන්ධ බවට සැක කරන බව ප්‍රකාශ කර ඇති බවත් ය.

ඒ අනුව 2022.12.25 වන දින පැය 15.20ට උප පොලිස් පරීක්ෂක ජයසේන නිලධාරියා විසින් මෙම පැමිණිල්ලේ සඳහන් දරුවා අත්අඩංගුවට ගනු ලැබූ බවත්, ඔහුව අත්අඩංගුවට ගෙන ප්‍රකාශයක් සටහන් කරගනු ලැබූ බවත්, මෙම දරුවා අත්අඩංගුවට ගනු ලැබුවේ නිවසක් බිඳ දේපල සොරකම් කිරීම සම්බන්ධයෙන් අපරාධ නීතිය යටතේ වන බවත්, අත්අඩංගුවට ගත් මෙම දරුවාට 2022.12.25 වන දින පැය 17.30ට ඇප ලබා දුන් බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

එසේම, අත්අඩංගුවට ගත් විජේසිංහ මුදියන්සේලාගේ පවන් සත්සර නැමති දරුවා බාල වයස්කාර දරුවෙකු වන බැවින් 2023.01.04 වන දින පරිවාසය මගින් අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, 2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහය පනතේ 02 වගන්තිය ප්‍රකාරව ළමයාගේ වයස අවුරුදු 07 සිට 12 දක්වා දීර්ඝ කර ඇති හෙයින් චෝදනා ගොනු කිරීමක් සිදුනොකරන බැවින් පොළොන්නරුව ම/උ B 594/22/02 දරණ නඩුවට අදාලව මෙම වරද ළමා සැකකරුවෙකු විසින්

සිදුකර ඇති බවට සඳහන් කරමින් 2023.01.04 වන දින අධිකරණය වෙත කරුණු වාර්තා කළ බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාවේ සඳහන් කර ඇත.

තවද, මෙම ළමා සැකකරු සන්තකයේ තිබී සොයා ගන්නා ලද භාණ්ඩ නඩුබඩු කුවිතාන්සි 1238/22 යටතේ ඇතුලත් කර අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද බවත්, අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු විනිසුරුතුමිය විසින් දරුවා පරිවාස අධීක්ෂණයට ලක් කරන ලද බවත්, ළමා සැකකරු අධිකරණයේදී වරද පිළිගෙන ඇති බවත් 2 වන වගඋත්තරකරු විසින් සිය වාර්තාව තුළින් දක්වා ඇත.

<u>නිරීක්ෂණ සහ නිගමනය</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන තම දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අයට එරෙහිව සොරකම් කිරීමේ චෝදනාවක් ඉදිරිපත් කර අරලගංවිල පොලිස් ස්ථානය වෙත රැගෙන ගොස් පහරදීමක් සිදුකර තම දරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරන ලද බවයි.

වගඋත්තරකාර පාර්ශවය විසින් කියා සිටින්නේ, මුදල් හා දේපල සොරකම් කිරීමක් සම්බන්ධයෙන් අරලගංවිල පොලිස් ස්ථානය වෙත ලද පැමිණිල්ලකට අනුව සිදුකරන ලද විමර්ශනයක් අනුව පැමිණිලිකරුගේ දරුවා පොලිස් ස්ථානය වෙත කැඳවා ප්‍රකාශයක් සටහන් කරගත් බවත්, මෙම දරුවාට තමා විසින් නීතිවිරෝධී චෝදනාවක් ගොනු කොට නොමැති බවත්, පොලිස් ස්ථානය තුළ දී දරුවාට පහරදීමක් සිදුකොට නොමැති බවත් ය.

2022.11.27 වන දින පැය 08.20ට අරලගංවිල පොලිස් ස්ථානය වෙත නිවසක් බිඳ මුදල් හා දේපල සොරා ගැනීමක් සම්බන්ධව පැමිණිල්ලක් පට්ටිය ගමරාලගේ සමීර මධුරංග වික්‍රමතිලක යන අය විසින් සිදු කර ඇති බවත්, එම පැමිණිල්ල අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 328 හා ඡේදය 138 යටතේ සටහන් කොට ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ලේ විමර්ශන කටයුතු සඳහා ප්‍ර. පො. ප. ප්‍රදීප් නිලධාරියා, 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයසේන හා පොලිස් සැරයන් 21602 යටිවැල්ල යන නිලධාරීන් දෙදෙනා සමඟ 2022.11.27 දින පැය 10.00ට පිටුව 330 හා ඡේදය 139 යටතේ පිටව යාමේ සටහන් යොදා පොලිස් ස්ථානයෙන් පිටව ගොස් ඇති බවත්, අදාළ අපරාධ ස්ථානය පරීක්ෂා කර නැවත පොලිස් ස්ථානය වෙත පැමිණ ඇති බවත් පෙනී යයි.

වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් 2022.12.25 වන දින සිදුකර ඇති බවට ඔවුන් විසින් ඉදිරිපත් කර ඇති අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 93 ඡේදය 116 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වන අතර, සොරකම සිදුවූ නිවසේ අයිතිකරු වන පට්ටිය ගමරාලගේ සමීර මධුරංග වික්‍රමතිලක යන අය විසින් පොලිස් ස්ථානය වෙත 2022.11.27 වන දින කරන ලද පැමිණිල්ලට අමතරව 2022.12.25 වන

දින ද තොරතුරු ලබා දී ඇති බවත්, එදින පට්ටිය ගමරාලලගේ සමීර මධුරංග වික්‍රමතිලක යන අය විසින් ඔහුගේ පුතා වන දුමිදු සස්විත යන අයගේ පන්තියේ අධ්‍යාපනය ලබන පැමිණිලිකරුගේ පුතා වන මෙම පැමිණිල්ලේ වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය විසින් අදාළ සොරකම සිදු කර ඇති බවට පොලිස් නිලධාරීන් වෙත තොරතුරු ලබා දී ඇති බවත්, එම තොරතුරු 2022.12.25 දින පැය 15.45ට අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 93 ඡේදය 116 යටතේ සටහන් කොට ඇති බවත් නිරීක්ෂණය වේ.

ඉහත කී ලෙස 2022.12.25 වන දින ලබාගෙන ඇති තොරතුරු මත පදනම්ව 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ජයසේන හා පොලිස් සැරයන් 21602 යටිවැල්ල යන නිලධාරීන් දෙදෙනා පැමිණිලිකරුගේ නිවස වෙත ගොස් ඇති බවත්, පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අයගෙන් තොරතුරු ලබාගෙන ඇති බවත්, එම අවස්ථාවේදී පැමිණිලිකරුගේ දරුවා විසින් සොරා ගෙන ඇති භාණ්ඩ පොලිස් නිලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති බවත් ඉහත කී අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 93 ඡේදය 116 යටතේ යොදා ඇති සටහන අනුව නිරීක්ෂණය වේ.

තවද, පැමිණිලිකරු හට ඔහුගේ දරුවා සමඟ පොලිස් ස්ථානය වෙත පැමිණෙන ලෙස 1 වන වගඋත්තරකරු විසින් දන්වා ඇති බවත්, ඒ අනුව පැමිණිලිකරු තම දරුවා සමඟ 2022.12.25 වන දින පොලිස් ස්ථානය වෙත ගිය පසු පැය 15.20ට පමණ නිවසක් බිඳ දේපල සොරා ගැනීම සම්බන්ධ චෝදනාවට පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය පොලිස් ස්ථානයේ දී අත්අඩංගුවට ගෙන ඇති බවත් ඉහත කී පොලිස් ස්ථානයේ තොරතුරු පොතේ සටහන අනුව නිරීක්ෂණය වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ලද උධෘතයන් අනුව නිවසක් බිඳ දේපල සොරකම් කිරීම පිළිබඳ පැමිණිල්ලක් 2022.11.27 වන දින අරලගංවිල පොලිස් ස්ථානය වෙත ලැබී ඇති බවටත්, එම පැමිණිල්ල අනුව 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ඩී. එම්.ජයසේන නම් නිලධාරියා සොරකමට අදාළ පැමිණිල්ලේ විමර්ශනය ආරම්භ කර ඇති බවටත්, පොලිස් ස්ථානය වෙත ලද ඉහත කී පැමිණිල්ලේ සොරකම සිදු කළ තැනැත්තා පිළිබඳව නිශ්චිත තොරතුරු නොදන්වා තිබූ බැවින් අදාළ අපරාධය පිළිබඳ කරුණු අධිකරණය වෙත වාර්තා කර ඇති බවත් නිරීක්ෂණය වේ.

අනතුරුව ඉහත කී සොරකමට අදාළ පැමිණිල්ල ලැබී මසක පමණ කාලයක් ගිය පසු 1 වන වගඋත්තරකරු විසින් සිදුකරන ලද විමර්ශනයකදී අදාළ සොරකම පිළිබඳව පැමිණිල්ල සිදුකළ පාර්ශවයෙන්ම මෙම සොරකම පිළිබඳ තොරතුරු නැවත 1 වන වගඋත්තරකරු වෙත ලබාදී ඇති බවත්, අදාළ තොරතුරු මත පදනම්ව 1 වන වගඋත්තරකරු විසින් සිදුකළ විමර්ශනයේදී සොරාගත් භාණ්ඩ හා භාණ්ඩ සොරකම් කළ අයව සොයා ගැනීමට හැකිවී ඇති බවත් 1 වන වගඋත්තරකරුගේ ප්‍රකාශ, උධෘත අනුව නිරීක්ෂණය වේ. ඒ අනුව 1 වන වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ඩී.එම්.

ජයසේන විසින් සොරකම සම්බන්ධයෙන් වයස අවුරුදු 10ක දරුවෙකු ඔහුගේ දෙමාපියන් සමඟ අරලගංවිල පොලිස් ස්ථානය වෙත කැඳවීමෙන් පසුව අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

වයස අවුරුදු 10ක් වූ පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර (අගතියට පත් පාර්ශවය) යන අය අත්අඩංගුවට ගැනීමෙන් පසුව ප්‍රකාශයක් ලබාගෙන ඇති අතර, එකී ප්‍රකාශය අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ පිටුව 95 ඡේදය 117 යටතේ පැය 16.15ට සටහන් කොට ඇති බවත්, සොරකම සම්බන්ධයෙන් පැමිණිලි කර ඇති අයගේ නිවසේ තිබී නැති වූ භාණ්ඩ කිහිපයක් තමා රැගෙන ගිය බවට පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර (අගතියට පත් පාර්ශවය) යන අය විසින් එකී ප්‍රකාශය මගින් පිළිගෙන ඇති බවත්, එම දරුවා සන්තකයේ තිබූ භාණ්ඩ 2022.12.25 දිනම අංක 1237/22 හා 1238/22 යටතේ නඩුබඩු ලෙස ලේඛණගත කොට ඇති බව ද නිරීක්ෂණය වේ.

1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ කර සිටියේ, 2022.12.25 වන දින අත්අඩංගුවට ගත් පැමිණිලිකරුගේ දරුවා වයස අවුරුදු 10ක පමණ දරුවෙකු වන බැවින් ඔහුට එරෙහිව අපරාධමය වරදක් යටත් අධිකරණයේ චෝදනා ගොනු කොට නොමැති බවත්, මෙම දරුවාට එරෙහිව කිසිදු නඩු විභාගයක් පවත්වා ගෙන නොයන බවත්, 2022.11.25 වන දින වාර්තා වූ අදාළ අපරාධය සම්බන්ධයෙන් අංක බී594/22/2 යටතේ අධිකරණය වෙත ඉදිරිපත් කර තිබූ වාර්තාව ඉවත් කරගෙන ඇති බවත්, මෙකී දරුවාට එරෙහිව අධිකරණය වෙත කරුණු වාර්තා කිරීමක් සිදුව නොමැති බවත් ය.

1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත සිදු කර ඇති ප්‍රකාශය හා ඔහු විසින් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති පොලිස් සටහන් උධෘත අනුව පැමිණිලිකරුගේ අවුරුදු 10ක් වයසැති දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අයව 2022.12.25 වන දි පැය 15.20ට අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධිත පනත මගින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 75 වගන්තියට අනුව වයස අවුරුදු 12ට අඩු ළමයෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ යනුවෙන් දක්වා තිබේ. පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය වයස අවුරුදු 12ට අඩු දරුවෙකු වන බැවින් ඔහු විසින් සිදුකර ඇති ක්‍රියාව වරදක් ලෙස සැලකිය නොහැකි බව මෙම වගන්තිය අනුව තහවුරු වේ.

අරලගංවිල පොලිස් ස්ථානයේ බල අපරාධ තොරතුරු සටහන් පොතේ 2022.12.25 වන දින පැය 15.45ට පිටුව 93 සහ ඡේදය 116 යටතේ 1 වන වගඋත්තරකරු විසින් යොදා ඇති සටහන අනුව පොලිස් ස්ථානය වෙත සොරකම සම්බන්ධයෙන් පැමිණිල්ල ඉදිරිපත් කළ පට්ටිය ගමරාළලාගේ සමීර මධුශංක වික්‍රමතිලක විසින් වැඩිදුර තොරතුරු ලබා දීමේදී, කොමිෂන් සභාවේ මෙම පැමිණිල්ලේ පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අය, පට්ටිය ගමරාළලාගේ

සමීර මධුශංක වික්‍රමතිලක යන අයගේ පුතා සමඟ පාසලේ 5 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අයගේ වයස අවුරුදු 10ක් බවත්, වයස අවුරුදු 12ට අඩු වන බැවින් එම දරුවා විසින් සිදුකර ඇති ක්‍රියාව වරදක් නොවන බව දැන සිටියදීම 1 වන වගඋත්තරකරු විසින් එම දරුවා පොලිස් ස්ථානය වෙත කැඳවා අත්අඩංගුවට ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 32(1)(ආ) වගන්තිය යටතේ යම් තැනැත්තෙකුට එරෙහිව සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබේද, එසේ නම් එවැනි තැනැත්තෙකු අත්අඩංගුවට ගත හැකි බව සඳහන් කොට තිබේ.

මෙම වගන්තියට අනුව පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සරට එරෙහිව පොලිස් ස්ථානය වෙත සාධාරණ පැමිණිල්ලක් ලැබී තිබුණ ද, 2018 අංක 10 දරණ දණ්ඩ නීති සංග්‍රහය සංශෝධන පනතේ 2 වගන්තිය අනුව සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 75 වගන්තිය අනුව වයස අවුරුදු 12ට අඩු ළමයෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවේ යනුවෙන් දක්වා තිබිය දී පැමිණිලිකරුගේ වයස අවුරුදු 10ක් පමණ වන දරුවා වරදක් සිදුකොට ඇති බවට චෝදනා කරමින් අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු අත්අඩංගුවට ගැනීම නොකළ යුත්තේය යන වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අයගේ මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

1 වන වගඋත්තරකරුගේ ප්‍රකාශ හා උධෘතයන් අනුව පැමිණිලිකරු හා දරුවා 2022.12.25 වන දින පොලිස් ස්ථානය වෙත කැඳවා ඇති බව තහවුරු වන අතර, දරුවා මෙදින පැය 15.20ට අත්අඩංගුවට ගෙන පැය 15.45ට උපසේවයට භාරදී ඇති බව 1 වන වගඋත්තරකරු විසින් 2022.12.25 හා පිටුව 93 ඡේදය 116 යටතේ යොදා ඇති සටහන අනුව පෙනී යයි. එමෙන්ම මෙම දරුවා උප සේවය වෙත භාරදෙන අවස්ථාවේදී 1 වන වගඋත්තරකරු විසින් සටහන් යොදා ඇත්තේ ස්ථානාධිපතිගේ උපදෙස් ලැබෙන තෙක් රඳවා තබා ගැනීම සඳහා උපසේවයට භාර දෙනු ලබන බවයි. 1 වන වගඋත්තරකරුගේ මෙකී සටහන් අනුව පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අයව පොලිස් භාරයේ රඳවා ගෙන සිට ඇති බව තහවුරු වන අතර, මෙමගින් දරුවාගේ නිදහස අහිමි කිරීමට 1 වන වගඋත්තරකරු මූලික වී කටයුතු කොට ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු තම බිරිඳ හා දරුවා සමඟ 2022.12.25 වන දින පෙ.ව. 9.00ට පොලිස් ස්ථානය වෙත ගිය බවටත්, ඔවුන් දරුවා සමඟ පෙ.ව. 9.00 සිට ප.ව.6.00 දක්වා පොලිස් ස්ථානය තුළ රැඳී සිටින ලද බවටත් පැමිණිල්ල මගින් කරුණු ඉදිරිපත් කරන අතර, වෙනත් සාක්ෂියක් ඉදිරිපත් කර නැත. කෙසේ වෙතත් පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අයගේ අංක 61/23 දරණ අධිකරණ වෛද්‍ය වාර්තාවේ රෝගියාගේ කෙටි ඉතිහාසය අනුව 2022.12.25 වන දින පෙ.ව. 11.00ට

පමණ අරලගංවිල පොලිස් ස්ථානයේ නිලධාරියෙකු විසින් පොලිස් ස්ථානයේදී තම බෙල්ල පිටුපසට හා ඔළුවට පහරදුන් බවට පැමිණිලිකරුගේ දරුවා විසින් ප්‍රකාශ කර ඇති බවට සටහන් කොට ඇත. ඒ අනුව 2022.12.25 වන දින පෙ.ව. 11.00ට පැමිණිලිකරුගේ දරුවා අරලගංවිල පොලිස් ස්ථානයේ සිට ඇති බවට නිරීක්ෂණය වන බැවින් 1 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුගේ දරුවා 2022.12.25 වන දින පැය 15.20ට අත්අඩංගුවට ගත් බවට යොදා ඇති සටහන පිළිගැනීම ගැටලු සහගත බව කොමිෂන් සභාව වෙත නිරීක්ෂණය වේ.

මෙම දරුවාට එරෙහිව 1 වන වගඋත්තරකරු විසින් තොරතුරු අනාවරණය කර ගන්නා අවස්ථාවේදී ඔහු වයස අවුරුදු 10ක දරුවෙකු බව දැනගෙන සිට ඇති බැවිනුත්, වයස අවුරුදු 12ට අඩු දරුවෙකු විසින් කරනු ලබන කිසිවක් වරදක් නොවන බව 1 වන වගඋත්තරකරු විසින් දැනගෙන සිටි බැවිනුත්, මෙම දරුවා 2022.12.25 වන දින අත්අඩංගුවට ගෙන ඔහුව රඳවා තැබීම සඳහා උපසේවයට භාරදීමත්, එසේ භාරදී තවදුරටත් ස්ථානාධිපතිගේ නියෝග ලැබෙනතෙක් දරුවා රඳවා තබා ගැනීම සඳහා සටහන් යෙදීමත්, ඉදිරිපත්ව ඇති කරුණු අනුව පැමිණිලිකරුගේ දරුවා පෙ.ව. 11 පමණ සිට ඔහු වෙත ඇප ලබා දී ඇති ප.ව. 5.30 තෙක් පොලිස් ස්ථානය තුළ රඳවාගෙන සිට ඇති බවට තහවුරු වීමත් යන කරුණු තුළින්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(2) ව්‍යවස්ථාවෙහි සඳහන් අත්තනෝමතිකව රඳවා තබා ගැනීමෙන් නිදහස් වීමට වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අයට ඇති මූලික අයිතිවාසිකම 1 වන වගඋත්තරකරු විසින් උල්ලංඝණය කොට ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

පැමිණිලිකරු තම පැමිණිල්ල මගින් වැඩිදුරටත් කියා සිටින්නේ, තම දරුවා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය පසු තම දරුවා උදේ 9.00ට පමණ පොලිස් ස්ථානය තුළ ඇති කාමරයකට රැගෙන ගිය බවත්, එසේ රැගෙන ගොස් දරුවා ප.ව. 6.00 පමණ වනතෙක් එම කාමරයේ රඳවා සිටි බවත්, දරුවා තමා හා බිරිඳ වෙත භාරදෙන විට දරුවා ඔහුට පහරදුන් බවත්, ඔහුගේ ඔළුව කාමරයේ තිබූ මේසයේ වැද්දවූ බවත් පවසා සිටි බවත්, එවිට දරුවා දෙමාපියන් ළඟට දුවගෙන එනවිට පොලිස් නිලධාරියෙක් දරුවාගේ බෙල්ලෙන් අල්ලා පුටුවක් වෙතට තල්ලු කළ බවත්, එහිදී දරුවාගේ බෙල්ල සීරීමකට ලක්ව තිබූ බවත්, තමාට දරුවා භාරදුන් විට දරුවාගේ ඔළුව රිදෙන බව පැවසූ හෙයින් දරුවා රෝහල්ගත කළ බවත් ය.එසේම, පැමිණිලිකරු ගේ දරුවා වන අගතියට පත් පාර්ශවය වන ඩබ්ලිව්. එම්. පවන් සත්සර යන අය 2023.08.29 වන දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේ දී 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරික්ෂක ඩී.එම්.ජයරත්න යන අය තමාගේ බෙල්ලට හා පිට ප්‍රදේශයට පහර කිහිපයක් ගැසූ බවට ප්‍රකාශ කර ඇත.

දරුවාට සිදුවූ බව පවසන පහරදීම සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය වාර්තාව පොළොන්නරුව මහ රෝහල වෙතින් කැඳවා ඇති අතර, එම අධිකරණ වෛද්‍ය වාර්තාව මගින් පහත තොරතුරු අනාවරණය කර ඇත.

පහරදීමකට ලක්වූ දරුවා 2022.12.26 වන දින පෙ.ව.11.10ට පොළොන්නරුව රෝහලට ඇතුලත් කර ඇති අතර, රෝගියාගේ කෙටි ඉතිහාසය අනුව 2022.12.25 වන දින උදේ 11.00ට පමණ අරලගංවිල පොලිස් ස්ථානයේ නිලධාරියෙකු විසින් පොලිස් ස්ථානයේදී ඔහුගේ බෙල්ල පිටුපසට හා ඔළුවට පහරදුන් බව සටහන් කොට ඇත.

එමෙන්ම දරුවාගේ ශරීරයේ පැවති තුවාල පහත පරිදි සටහන් කර ඇත.

“There was an abrasion measured 1 cm x 0.1cm at left side of the back of the neck.”

මෙම තුවාලය බරපතල නොවන තුවාලයක් ලෙසත්, මොට ආයුධයකින් ඇතිවිය හැකි තුවාලයක් ලෙසත් අධිකරණ වෛද්‍ය වාර්තාවේ ‘තුවාල සිදුවී ඇති අයුරු’ යන්න යටතේ දක්වා තිබේ.

පැමිණිලිකරුගේ දරුවා පොලිස් ස්ථානයේ කාමරය තුළ සිටින විටදී අඩන ශබ්දයක් ඇසුනු බවත්, එවිට දරුවා බැලීමට යාමට ගිය නමුත්, බලන්න යන්න නොදුන් බවත්, එහිදී දරුවාට පහරදීමක් සිදුවන බව තමාට තේරුම් ගිය බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත.

දරුවා හා දරුවාගේ දෙමාපියන් විසින් කරනු ලබන පහරදීමේ චෝදනාව 1 වන වගඋත්තරකරු ප්‍රතික්ෂේප කර ඇති අතර, 2023.08.29 වන දින පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් කොමිෂන් සභාව ඉදිරියේ පවත්වනු ලැබූ පරීක්ෂණයේදී ද 1 වන වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියේ, මෙම දරුවාට පහරදීමක් සිදුනොකළ බවයි. වගඋත්තරකරු විසින් දරුවාට කිසිදු පහරදීමක් සිදුනොකළ බවට පමණක්ම ප්‍රකාශ කර ඇති අතර, මෙම චෝදනාව ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රබල තර්කයක් ගොඩ නඟා නැත.

දරුවා සම්බධයෙන් ඉදිරිපත්ව ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව දරුවාගේ බෙල්ලේ පිටුපස සීරීම් තුවාලයක් ඇති බවට සඳහන් කර තිබීම තුළින් ද, අගතියට පත් දරුවා විසින් ද 1 වන වගඋත්තරකරු විසින් ඔහුගේ බෙල්ල පිටුපසට පහරදීමක් සිදුකරන ලද බව ප්‍රකාශ කිරීම තුළින් පහර දුන් ස්ථානය සහ පවතින තුවාලය එකිනෙක සමාන වන බැවින් 1 වන වගඋත්තරකරු විසින් දරුවාට පහරදීමක් සිදුකර ඇති බව සනාථ වේ.

ඒ අනුව 1 වන වගඋත්තරකරු විසින් වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අයගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කර ඇති කිසිම තැනැත්තෙකු වධහිංසාවකට හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැළකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බවට වන අයිතිවාසිකම උල්ලංඝණය වී ඇති බව ද මෙයින් නිගමනය කරනු ලැබේ.

එසේම, තමා යටතේ සිටින නිලධාරීන් නීතියට අනුව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීමට ස්ථානාධිපතිවරයා විෂයෙහි වගකීමක් පවතින බවත්, එසේ කටයුතු නොකළහොත් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිදැලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ

රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන අයිතිවාසිකම කඩ කිරීම සම්බන්ධයෙන් වගකීමෙන් බැඳෙන බවත් **මොහොමඩ් රෂීඩ් ෆාතිමා ෂර්මිලා** එදිරිව **පො.සැ. 31118 කේ.ඩබ්.ජී. නිශාන්ත සහ තවත් අය** **(SC FR Application No. 398/2008)** නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ඉහතින් දක්වා ඇති පරිදි 1 වන වගඋත්තරකරු විසින් අරලගංවිල පොලිස් ස්ථානය වෙත ලැබී තිබූ සොරකමක් සම්බන්ධයෙන් වූ පැමිණිල්ලට අදාළව වැඩිදුර පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පිටත්ව ගොස් ඇත්තේ 2 වන වගඋත්තරකරු වන ස්ථානාධිපතිවරයාගේ නියෝග පරිදි වන බවට පොලිස් ස්ථානයේ උධෘත අනුව නිරීක්ෂණය වන බැවින්, එකී පරීක්ෂණ කටයුතු අතරතුරදී 1 වන වගඋත්තරකරු විසින් පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අය වයස අවුරුදු 12ට අඩු දරුවෙකු බව දැනසිටිය දී පොලිස් ස්ථානය වෙත කැඳවා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයෙහි රඳවාගෙන ඇති බැවින් 2 වන වගඋත්තරකරු විසින් සිය අධීක්ෂණ වගකීම නිසි පරිදි ඉටු කිරීමට අපොහොසත්ව ඇති බව පෙනීයයි.

එසේහෙයින් ඉහත කී නඩු තීරණය තුළින් ද දක්වා ඇති පරිදි 2 වන වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අයගේ මූලික අයිතිවාසිකම ද උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ. කෙසේවෙතත් 2 වන වගඋත්තරකරු රෝගාතුරව සිට මේ වන විට මියගොස් ඇති බවට 1 වන වගඋත්තරකරු විසින් කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති බැවින් 2 වන වගඋත්තරකරු සම්බන්ධයෙන් නිර්දේශයක් නිකුත් කිරීමට කොමිෂන් සභාව අදහස් නොකරයි.

ඒ අනුව 1 වන වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11, 13(1) සහ 13(2) ව්‍යවස්ථාවන් තුළින් සුරක්ෂිත මූලික අයිතිවාසිකම් සහ 2 වන වගඋත්තරකරු විසින් 12(1) ව්‍යවස්ථාව තුළින් සුරක්ෂිත මූලික අයිතිවාසිකම පැමිණිලිකරුගේ දරුවා වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අය සම්බන්ධයෙන් උල්ලංඝණය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය ඉදිරිපත් කර සිටී.**

01. 1 වන වගඋත්තරකරු වන උප පොලිස් පරීක්ෂක ඩී.එම්. ජයසේන යන අය විසින් රුපියල් විසිපන්දහස (රු.25,000/-)ක මුදලක් වින්දිත පාර්ශවය වන ඩබ්ලිව්.එම්. පවන් සත්සර යන අය වෙනුවෙන් පැමිණිලිකරු වෙත වන්දි වශයෙන් ගෙවිය යුතු ය.

02. 1 වන වගඋත්තරකරු මෙම සිදුවීමේදී ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතු ය.

03. ළමයින් විසින් සිදු කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයන් වෙත ලැබෙන පැමිණිලි වලදී පොලිස් නිලධාරීන් විසින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව පොදු උපදෙස් මාලාවක් නිකුත් කිරීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු ය.

2025. 08 . 22 දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු(හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්-: 01. අමාත්‍යතුමා - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යාංශය ,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති - අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලීසිය

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.